සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදි එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදි වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය 82 හා ACA 6 ආකෘතිය අනුව දේපල පිරියත හා උපකරණ එකතුව රු.2,655,070,783 ක් වුවද, එය ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමේ රු.83,682,068 ක් ලෙස දැක්වීමෙන් රු.2,571,388,715 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ACA 6 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.72,783,826 ක් වුවද මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂයන් වූ 2102, 2103 හා 2104 යටතේ දරන ලද වියදම රු.76,794,447 ක් වූයෙන් රු.4,010,621 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.1.2 තැන්පතු ගිණුම් ශේෂ

තැන්පත් ගිණුම් 05 කට අදාලව රු.11,436,697 ක්වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද රු.5,724,303 ක වටිනාකමක් සහිත තැන්පතු 04 ක ශේෂයන් වසර 2 – 10 අතර කාලයක් තුලද, රු.5,854,553 ක වටිනාකමක් සහිත තැන්පතු 01 ක ශේෂයක් වසර 10 කට වැඩි කාලයක් තුලද තැන්පතු ගිණුමේ පැවතී තිබුණි.

1.6.1.3 අග්‍රිම ගිණුමේ ශේෂය

2021 වර්ෂය සඳහා රු.8,209,853,000 ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණද භාණ්ඩාගාරය විසින් රු.3,413,017,000 ක අග්‍රිම නිදහස් කර නොතිබුණි. එය ඉල්ලුම් කරන ලද මුළු අග්‍රිමයෙන් සියයට 42 ක් වී තිබුණි.

1.6.1.4 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් වශයෙන් දැක්විය යුතු රු.15,499,238 ක පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සහ රු.291,925 ක හැකියා වර්ධන වියදම්, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කලමනාකරණය

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොමැති පරිපූරක සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් යටතේ 276-1-0-1205 වැය විෂය සඳහා ලබාගත් රු.5,000,000 ක් සහ 276-1-0-1501 වැය විෂය සඳහා ලබාගත් රු.381,000,000 ක් ACA 2 (i) හා ACA 2 (ii) ආකෘතිවල පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ දැක්විය යුතු වුවද අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ දක්වා තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ඇස්තමේන්තුවල වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල් වර්ෂය තුළ වියදම් කිරීම ප්‍රමාණවත් නොවන බව හා එම ප්‍රතිපාදන වල සීමාව ඉක්මවා යෑමට ඉඩ ඇති බව පෙනී යන විට පමණක් යම් වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ වැය විෂයක ඉතිරි කිරීම් මාරු කර ගැනීමට කටයුතු කල යුතු වුවද, වැය විෂයන් 03 ක් සඳහා මාරු කර ගත් ප්‍රතිපාදන මුළුමනින්ම උපයෝජනය කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 ප්‍රකාරව අනිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුල කලමනාකරණය කර ගත යුතු වුවත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් 276-1-1-0-1002 වැය විෂය සඳහා වෙන් කරන ලද රු.25,500,000 ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ රු.1,700,000 ක අමතර ප්‍රතිපාදන මාරු කරගෙන වැය කර තිබුණි.

(ඈ) රජයේ උපායමාර්ගික වැඩසටහන අනුව සමාලෝචිත වර්ෂයේ යල කන්නයේ ගොවීන්ගෙන් වැඩි මිලට වී මිලදී ගැනීම සඳහා ක්‍රමවත් වැඩසටහනක් සකස් නොකිරීමත් වැඩසටහනින් අපේක්ෂිත අරමුණු සඵලදායීව ලගා කරගැනීම සඳහා සාධාරණ ලෙස උත්සාහ නොකිරීමත් මත 276-1-0-1205 වැය විෂය සඳහා මුළ ප්‍රතිපාදිත මුදල වන රු.5,000,000 ක් ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉතිරි කර තිබුණි.

(ඉ) ITMIS වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා windows 10 (genuine) මෙහෙයුම් පද්ධතිය වෙනුවෙන් මෘදුකාංග ලබාගැනීමට හා යන්ත්‍ර සේවා කිරීම සඳහා 2021 දෙසැම්බර් 13 දින මු.රෙ. 66 යටතේ රු.5,000,000 ක් ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණි. මාරු කිරීමට ඉල්ලීම් කරන අවස්ථාව වන විටද රජය විසින් ක්‍රියාත්මක කර තිබූ දැඩි සීමාකාරී ආනයන ප්‍රතිපත්ති මත අමතර කොටස් හිඟතාවයක් වෙළඳපල තුල පැවති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගිණුම් පියවිය යුතු බැවින් මෘදුකාංග ප්‍රසම්පාදනයටද කාලයක් ගත වන බව හොඳින් අවබෝධ වී තිබියදී අනවධානයෙන් යුතුව ප්‍රතිපාදන මාරුකර ගැනීම හේතුවෙන් මුළු ප්‍රතිපාදන වලින් සියයට 75 ක් හෙවත් රු.5,223,608 ක් ඉතිරිකර තිබුණි.

(ඊ) 32 -1354 හා UPPD 7129 දරන වාහන අළුත්වැඩියා කිරීම සඳහා 2021 දෙසැම්බර් 13 දින මු.රෙ.66 යටතේ රු.10,000,000 ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගිණුම් පියවිය යුතු බව හා එම කෙටිකාලය තුල අළුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව පිළිබඳ සැලකීමකින් තොරව අනවධානයෙන් ප්‍රතිපාදන මාරුකිරීම මත මුළ ප්‍රතිපාදන වලින් සියයට 73 ක් හෙවත් රු.10,243,036 ක් ඉතිරිකර තිබුණි.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) ඇස්තමේන්තු ගත වටිනාකම රු.10,819,337 ක් වූ බණ්ඩාරවෙල දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ ප්‍රතිපාදනය කරන ලද රු.6,000,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබූ නමුදු බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව විසින් ලබා දී තිබුණු රු.4,819,338 ප්‍රතිපාදන වලින් එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා යොදවා තිබුණි. කෙසේ වුවද 2022 ජනවාරි 24 දින වන විටත් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර නොතිබුණු අතර මහජනතාවට ප්‍රතිලාභ ලබාගත නොහැකිව පැවතුණි.

(ආ) සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට නිදහස් කර තිබුණු රු.35,462,350 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී 2021 වර්ෂයේ ඔක්තෝබර් 31 දිනට ප්‍රතිපාදන උපයෝජනය කර ව්‍යාපෘතියේ

අපේක්ෂිත ප්‍රතිලාභ ලභාකර ගෙන තිබේද යන්න පිළිබඳ ප්‍රමාණවත් පසු විපරම් කටයුතු සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. එසේම ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිලදී ගත් උපකරණ 2022 පෙබරවාරි මාසය වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(ඇ) පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයෙන් වෙන් කර තිබූ රු.5,970,000 ක ප්‍රතිපාදන මත සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කල කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් මස ආරම්භ කර දෙසැම්බර් මස අවසානය වන විට නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.5,181,937 ක් වැය කර තිබුණද 2022 පෙබරවාරි 10 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත කිසිදු උපකරණයක් ලබාදී නොතිබුණි.

(ඈ) ආපදා කලමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ස්වභාවික ආපදාවන්ගෙන් අවදානමට පත්වූ පිරිස් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂය වන විට නැවත පදිංචි කල යුතු පවුල් 4149 න් නෝරාගත් පවුල් ඒකක 315 ක් සඳහා වෙන් කර තිබූ රු.310,693,493 ක ප්‍රතිපාදන වලින් 2021 දෙසැම්බර් 31 දිනට රු.240,552,513 ක් වැයකර තිබුණු ද පවුල් ඒකක 55 ක් පමණක් නැවත පදිංචි කර තිබුණි.

2.3 ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
(i)	මුදල් රෙගුලාසි 137(5)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව වවුවර් වල සඳහන් භාණ්ඩ කාර්යාල වෙත ලැබී නොතිබියදී 2021දෙසැම්බර් 31 දින ලියන ලද රු.2,356,627 ක් වටිනා චෙක්පත් 12 ක් 2022 ජනවාරි 31 දින වන විටත් අත රඳවාගෙන තිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 371(2)	යම් නිශ්චිත කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිම එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සිව් දෙනෙකුට හා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සිව් දෙනෙකු වෙත අවස්ථා 13 කදී දෙන ලද අතුරු අග්‍රිම පියවීමේදී දින 05 සිට දින 57 දක්වා ප්‍රමාදයක් පැවතිනි.
(ආ)(i)	2006 නොවැම්බර් 29 දිනැති අංක ABK/N/1/2/22 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය	ග්‍රාම නිලධාරීන් විසින් තම කොට්ඨාශයේ හෙලන ලද කොස්ගස් ප්‍රමාණය පිළිබඳ සාරාංශ ගත වාර්තාවක් පිළියෙල කල යුතු වුවත් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2020 හා 2021 වර්ෂවල කපා හෙලන ලද කොස්ගස් 28 ක් පිලිබඳව වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ii)	2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	විශ්‍රාමයෙකු මියගිය විට දින 07 ක් තුල ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් නොකිරීම හේතුවෙන් මිය ගිය විශ්‍රාමිකයින් 16 දෙදෙනෙකු සඳහා රු. 404,415 ක් විශ්‍රාම වැටුප් වැරදි ආකාරයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් ගෙවා තිබුණි.
(iii)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පැමිණි හා පිටවූ වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කරගැනීමකින් තොරව 2021 වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ලෙස රු.2,540,388 ක් ගෙවා තිබුණු බව නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(iv)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකල යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වාහන 07 ක් සම්බන්ධයෙන් එසේ ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල නිකුත් කල දින සිට මාස 06 ක් ඉක්ම වූ රු.293,480 වටිනාකමැති චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට අපේක්ෂිත වූ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල හා මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම යන ක්‍රියාකාරකම් ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.800,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.291,925 ක් පමණක් වැය කර තිබීමෙන් සියයට 64 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී සියලුම පුහුණු කටයුතු ඉටුකර ඇති බව හා අපේක්ෂිත ප්‍රතිලාභ (out comes) ලගාකර ගෙන ඇති බව දක්වා තිබීමෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය වේ.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.594,174 ක් වැය කරමින් 2017 දෙසැම්බර් 19 දින වැඩ අවසන් කර තිබුණු ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාලයේ පැති විකට්ටුව මෙම වාර්තාව නිකුත් කරන දින වන විටද භාවිතයට ගත නොහැකිව පැවතිනි.

(ආ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 ගම්පෙරලිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කිරිවැල්කැටිය සිට ගිගිරිපුදාම දක්වා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 ජූලි 22 දින සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් සමඟ රු.993,398 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.966,336 ක් වැය කර තිබුණු අතර 2022 පෙබරවාරි 24 දින භෞතික පරීක්ෂාවේදී ඇස්තමේන්තුවේ සඳහන් ඉටු නොකල වැඩ විෂයයන් 03 ක් සඳහා රු.45,663 ක් ගෙවා තිබුණි.

5000 L ප්‍රමාණයේ ප්ලාස්ටික් ජල ටැංකිය සඳහා රු.2,574 ක් වැයකර තිබූ gate value සවිකර නොතිබුණු අතර වතුර මෝටරය හඳුනාගත හැකි කාණ්ඩ අංකය මකා දමා තිබුණි. රු.116,400 ක් වැයකර මිලදී ගෙන සවිකර තිබූ වතුර මෝටරය අක්‍රීයව පැවති බැවින් ප්‍රතිලාභී පවුල් වෙත පානීය ජලය ලබාදී නොතිබුණි. ව්‍යාපෘතියේ අවසන් බිල්පත් ගෙවීමේදී මැණුම්පතේ සඳහන් ප්‍රමාණයට වඩා රු.12,941 ක් ගෙවා තිබුණි.

(ඇ) 2019 ගම්පෙරලිය කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,224,750 ක් වැය කර ට්‍රැක් 02 නිවාස අසලින් වෙළඹය හරහා පාලමක් ඉදි කර තිබුණු අතර සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා මත පැවති අධික වර්ෂාවෙන් පාලමට හා කොන්ක්‍රීට් මාර්ගයට භෞතිකව දැඩි ලෙස හානි වී තිබුණි.

(ඈ) සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ රු.35,605,877 ක ප්‍රතිපාදන මත බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් යටතේ ක්‍රියාත්මක කළ සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් සවිබල ගැන්වීමේ වැඩ සටහන යටතේ 2021 දෙසැම්බර් 31 දිනට රු.21,545,879 ක් වැය කර තිබුණද අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබාගෙන නොතිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Out come) ලබා නොගැනීම

2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.982,560 ක ගිවිසුම්ගත මුදලකට නකහඩිය ක්‍රීඩා සමාජයේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය 2014 වර්ෂයේදී වැඩ අවසන් කර තිබුණද 2022 ජනවාරි 13 දින වන විටත් භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතිණි.

3.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ හින්දු කෝවිල් 06 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.600,000 ක් සහ හින්දු කෝවිල් 02 ක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.180,000 ක් ලෙස රු.780,000 ක් 2021 අගෝස්තු 12 දින හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබාදී තිබුණ ද 2022 මැයි 23 දින වන විටත් කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි.

(ආ) හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අධ්‍යර දෙකක් යටතේ බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ රු.4,000,000 ක ප්‍රතිපාදන මත කඳන ප්‍රදේශයේ ක්‍රියාත්මක කල සංස්කෘතික සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉපැරණි කර්මාන්ත ශිල්ප කලා ගම්මානය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඌව කඳන වැඩිහිටි සන්ධානය වෙත රු.3,231,920 ක් ගෙවා තිබුණි. 2021 නොවැම්බර් 30 දින වන විට එහි වැඩ නිමකල යුතු වුවද 2022 මැයි 23 දින වන විටත් ව්‍යාපෘතියේ කුඹල් ගෙදර, ධීවර ගෙදර, වැව, වැදි ගෙදර, පතල් වාඩිය , ගමේ කඩේ යන ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ඇ) මහියංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.140,961,320 ක ගිවිසුම්ගත මුදලකට 2017 දෙසැම්බර් 18 දින Finite Lanka ආයතනය සමග ගිවිසුම්ගතව තිබුණු අතර 2022 මාර්තු 15 වන විට රු.109,020,394 ක් වැය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුම්ගත දින සිට දින 546 කින් වැඩ අවසන් කල යුතු වුවද විගණිත දිනය වූ 2022 මාර්තු මස 15 වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. එදිනට වැඩ ප්‍රමාද කාලය දින 1547 ක් වූ අතර එය ඇස්තමේන්තු ගත කාලය මෙන් තුන් ගුණයකට ආසන්න වී තිබුණි.

(ඈ) ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ රු.6,000,000 ක ප්‍රතිපාදන මත ඇස්තමේන්තුගත පිරිවැය රු.5,636,026 ක් වූ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 4”– 6” දක්වා වූ මුක්කු වට ලී මිලදී ගෙන තිබුණි. 2021 දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව අනුව මීටරයක මිල රු.100 ක් වුවද මීටරයක් සඳහා සැපයුම්කරුගේ මිල රු.520 ක් ලෙස දික් අඩි 1665 ක් සඳහා රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකල යුතු වුවත් 2022 ජනවාරි 24 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. නියමිත කාලරාමුවකට අනුව ප්‍රසම්පාදන කටයුතු, මිලදී ගැනීම් කටයුතු හා ඉදිකිරීම් කටයුතු නොකිරීම හේතුවෙන් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා පමණක් රු.5,539,696 ක් වැය කර තිබුණි. සංවර්ධන කටයුතු සඳහා මිලදී ගන්නා ලද වැලි සහ මැටල් ඉදිකිරීම් ද්‍රව්‍ය ඉදිකිරීම් භූමියේ මිණුම් ලබා ගත හැකි වන සේ ගොඩ ගසා (filling) නොතිබුණු අතර මිලදී ගත් ප්‍රමාණයන්, වැඩ බිමට නිකුත් කල ප්‍රමාණයන් හා ශේෂයන් ලේඛනගත කර නොතිබුණි. දෛනික ද්‍රව්‍ය භාවිත හා ශේෂ වාර්තා පිළියෙල කර නොතිබුණු අතර සහතික කල නිමි වැඩ හා කෙරීගෙන යන වැඩ තක්සේරු කර වාර්තා කර නොතිබුණි.

3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

2019 වර්ෂයේ විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන යටතේ ඇස්තමේන්තුගත මුදල රු.99,245 ක් වූ හපුතලේ හාවඩන් මධ්‍යස්ථානයට ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා 2020 මාර්තු මස හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.98,990 ක මුදලක් ගෙවා තිබුණද විගණිත දිනය වූ 2022 මැයි 23 දින වන විටද අදාල කර්මාන්තයේ වැඩ ආරම්භ කර නොතිබුණි.

3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයේ රු.1,833,070 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබූ බණ්ඩාරවෙල මහ නගර සභා ක්‍රීඩාපිටිය අසල ඇවිදින මංතීරුව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දී, ඉටුකර ඇති බවට භෞතිකව හඳුනාගත නොහැකි අයිතම 02 ක් සඳහා රු.198,320 ක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය ඇවිදින මංතීරුවක් ලෙස භාවිතයට ගත හැකි පරිදි හඳුනාගත නොහැකි වූ අතර විවිධ ස්ථාන වල දෙදෙනෙකුට දෙපසට ගමන් කල නොහැකි පටු ස්ථාන පැවතුණි.

3.3 ප්‍රසම්පාදනයන්

ඇල්ල ආරුක්කු නවය පාලම වෙත ලගාවෙන විකල්ප මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ලංසු ඇගයීමේදී රු.5,921,418 කු වූ අවම ලංසුව අදාල ලංසුකරු විසින් පෙර කොන්ත්‍රාත්වල පලපුරුද්ද , මූල්‍ය සම්පත්වල හැකියාව හා සුදුසුකම් ඇගයීමට ප්‍රමාණවත් ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව වූ රු.6,357,337 ක ලංසුව පිළිගෙන තිබුණි. අවම ලංසුව ඉදිරිපත් කල ලංසුකරුගේ පලපුරුද්ද, සුදුසුකම් එම ලංසුකරු සමඟ සාකච්ඡා කොට නැවත පරීක්ෂාව මගින් ප්‍රසම්පාදනයේදී වඩා වාසිදායක තත්ත්වයක් අස්ථිත්වයට ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සැලකිලිමත් නොවී දෙවන අවම ලංසුව තෝරාගැනීම හේතුවෙන් රු.435,923 ක අලාභයක් සිදුවී තිබූ අතර ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) අනුව ප්‍රසම්පාදනය සිදුකිරීමේ අරමුණු ඉටු කරගෙන නොතිබුණි.

3.4 වත්කම් කලමනාකරණය

නායයෑම් අවදානම් නොමැති බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් තහවුරු කල හා අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි බව දිස්ත්‍රික් ඉංජිනේරු විසින් සහතික කළ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පල්ලේපේරුව ග්‍රාම නිලධාරි නිල නිවාස අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර වසර 12 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

3.5. නිෂ්කාර්ය වත්කම්

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු යතුරු පැදි 03 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සතු යතුරු පැදියක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් සතු කැබරථ 02 ක් අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර වසර 05 සිට වසර 16 දක්වා වූ කාල පරාසයක සිට නිශ්ක්‍රීයව කාර්යාල පරිශ්‍රයන්හි රඳවා තිබුණි.

3.6 පාඩු හා හානි

(අ) ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 250-2069 දරන කැබ් රථය 2010 අගෝස්තු 25 දින අනතුරට පත් වී තිබුණු අතර තක්සේරු ගත අලාභය වූ රු.500,000 ක මුදල 2022 මාර්තු 21 වන විටද අයකරගෙන නොතිබුණු අතර වාහනය අළුත්වැඩියා කර ධාවන තත්ත්වයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර වසර 12 කට අධික කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි.

(ආ) ඌව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් UPPC – 3214 දරන කැබ් රථය 2015 සැප්තැම්බර් 04 දින අනතුරට පත්ව තිබුණු අතර සිදු වූ රු.70,834 ක අලාභයෙන් රක්ෂණයේ දී ප්‍රතිපූරණය නොකල රු.64,459 ක් 2022 මාර්තු 21 දින වන විටද මුදල් රෙගුලාසි 104(3) අනුව පොත් වලින් කපාහැරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 250-2073 දරන කැබ් රථය 2010 නොවැම්බර් 03 දින අනතුරට පත්වීමෙන් සිදු වූ රු.1,400,000 ක අලාභය අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයට එරෙහිව පවරා තිබූ නඩුවේ තීන්දුව 2019 ඔක්තෝබර් 07 දින ප්‍රකාශයට පත්කර තිබුණි. ඒ අනුව කටයුතු කර රජයට සිදු වූ අලාභය අයකර ගැනීමට 2022 මාර්තු 24 වන විටද කටයුතු කර නොතිබුණි.

(ඈ) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අංක UPPD – 7129 දරන කැබ් රථය 2017 ජූලි 29 දින අනතුරට පත් වී තිබුණු අතර සිදු වූ රු.634,933 ක අලාභයෙන් රු.2,500,000 ක් රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණ කර තිබුණි. 2022 මාර්තු 24 දින වන විටද රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය නොකල රු.3,849,333 ක අලාභය අයකරගෙන නොතිබුණි. රක්ෂණ වන්දි මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර රථය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි.

(ඉ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක WPPC – 4311 දරන කැබ්රථය 2017 අගෝස්තු 18 දින අනතුරට පත් වීමෙන් 2019 පෙබරවාරි 12 දින වන විට අළුත්වැඩියා කර තිබුණි. බිල්පත් වටිනාකම රු.3,057,331 ක් වී තිබුණු අතර රක්ෂණ මඟින් ප්‍රතිපූර්ණ නොකල රු.126,095 ක මුදල ගෙවා වාහනය නිදහස් කර ගැනීමට කටයුතු නොකර 2022 මාර්තු 24 දින වන විටද වසර 03 ක පමණ කාලයක් අළුත්වැඩියා සිදුකල ගරාජයේ නිෂ්කාර්යව රඳවා තිබුණි. එසේම මේ පිළිබඳව විගණනයේදී දිගින් දිගටම පෙන්වා දීමෙන් පසුද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.7 අනාර්ථික ගනුදෙනු

ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩ සටහන යටතේ රු. 493,279 ක ගිවිසුම්ගත මුදලකට ස්වේච්ඡා සංවිධානයක් මඟින් ඉටුකරවා ගත් කිරවනාගම ප්‍රධාන බස් මාර්ගයේ සිට වහුගාල තැන්න දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේදී ඉටු නොකල අයිතමයන් 02 ක් සඳහා රු. 15,445 ක් ගෙවීම් කර තිබුණි.

3.8 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම

2021 නොවැම්බර් 29 දින සිට 2022 මාර්තු 22 දක්වා කාලය තුල නිකුත් කල විගණන විමසුම් 13 කට 2022 අප්‍රේල් 19 දින වන විටද පිළිතුරු සපයා නොතිබුණි.

3.9 කලමනාකරණ දුර්වලතා

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් මගින් කාන්තා කාර්යාංශ ණය වැඩසටහන යටතේ 2012 – 2020 අතර කාලය තුල ප්‍රතිලාභීන් 188 ක් වෙත අපේක්ෂා ණය වැඩ සටහන යටතේ ලබාදී තිබුණු ණය මුදලින් රු.1,513,454 ක් ද වක්‍රීය ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 92 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් රු.354,939 ක්ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අපේක්ෂා ණය ගෙවීම සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමෙහි රු.863,305 ක් හා වක්‍රීය ණය ගෙවීම සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමෙහි රු.476,948 ක ශේෂයක් විගණිත දිනය වූ 2021 නොවැම්බර් 01 වන විට පැවති අතර කාර්යාලය වෙත ණය අයදුම්පත් 15 ක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය තුල කිසිදු ණය මුදලක් නිදහස් කර නොතිබුණි.

(ඇ) හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අපේක්ෂා ණය වැඩ සටහනට අදාලව පවත්වාගෙන යන බැංකු ගිණුමේ රු.1,145,193 ක් හා වක්‍රීය ණය වැඩ සටහනට අදාලව පවත්වාගෙන යන බැංකු ගිණුමේ රු.703,958 ක මුදලක් 2021 නොවැම්බර් 30 දින වන විට පැවති අතර ණය අයදුම්පත් 27 ක් කාර්යාලය වෙත ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය තුල කිසිදු ණය මුදලක් නිදහස් කර නොතිබුණි.

(ඈ) 2021 අප්‍රේල් 27 දින සිට ජූනි 05 දින දක්වා කාලය තුල ඇති වූ අපදා තත්ත්වය හේතුවෙන් හානි සිදු වූ නිවාස වලට රු.10,000 දක්වා වන්දි ගෙවීම සඳහා 2021 ඔක්තෝබර් 28 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.130,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණ ද එම කාල සීමාව තුල සිදු වූ නිවාස හානි 10 ක් සඳහා 2021 නොවැම්බර් 23 දින වන විටද වන්දි ගෙවා නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් විවිධ ණය වැඩසටහන් යටතේ සමෘද්ධි ලාභීන් 4976 ක් වෙත ලබාදෙන ලද ණය මුදලින් රු.219,692,070 ක් ණය ශේෂ කල් පසුවී තිබුණු අතර ණයලාභීන් 989 ක් වෙත ලබාදෙන ලද ණය මුදලින් රු. 42,997,627 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි. මෙම හිඟ ණය අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවකට නිලධාරීන් මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතුය. පළාත් සභා ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.653,965 ක ණය ශේෂයන් 2020 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි.

(උ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නිරතව සිට විශ්‍රාම ලැබූ, වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයින් 03 දෙනෙකුගේ වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.185,281 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්ති අනුව කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

(ඌ) විවිධ ආයතන විසින් සිදු කර තිබුණු වැරදි හර කිරීම් සහ වැරදි බැර කිරීම් හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය යටතේ රු.81,550 ක ණය ශේෂ 02 ක්ද ගෙවිය යුතු ණය යටතේ රු.14,067 ක ණය ශේෂ 02 ක්ද අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබූ අතර එම වැරදි සටහන් හඳුනාගෙන මාසයක සිට වසර 05 ක් දක්වා කාල පරාසයක් ගතවී ඇතත් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, ග්‍රාමීය ජල සම්පාදනය, වාරි මාර්ග කටයුතු, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය හා අපනයන කෘෂිකර්ම කටයුතු යන තිරසර සංවර්ධන අරමුණු වලින් සියයට 20 සිට සියයට 57 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකරගෙන නොතිබුණි.

5. යහපාලනය

මහජනයා වෙත සේවා ඉටු කිරීම

ජනාධිපති ලේකම්ගේ 2020 සැප්තැම්බර් 15 දිනැති අංක PC/GPA/Circular/29/2020 දරන ජනාධිපති චක්‍රලේඛය අනුව සියළුම රජයේ ආයතන වල නිලධාරීන් මහජන දිනය වන "සඳුදා" දිනය තුල තම කාර්යාලයේ රැඳි සිටිය යුතු අතර අත්‍යවශ්‍ය කටයුත්තකට හැර එදිනට නිවාඩු ගැනීමෙන් වැලකිය යුතු බව අවධාරණය කර තිබියදී ඇල්ල, හාලිඇල සහ මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් සඳුදා දිනය තුල කාර්යාලයේ සේවයට වාර්තා කර නොතිබූ බව නියැදි පරීක්ෂණ වලදී තහවුරු විය.

6. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම්

2021 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 26 ක පුරප්පාඩු 191 ක් පැවතිණි.

සේවා වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
මට්ටම	53	41	12
තෘතියික මට්ටම	48	28	20
ද්විතියක මට්ටම	1179	1024	155
ප්‍රාථමික මට්ටම	142	138	4
එකතුව	1422	1231	191

ආර්.ජී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්.ජී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් - 01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
වැටුප් හා වේතන, රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී, වෙනත් දීමනා		✓	
අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප්	✓		
ගමන් වියදම් (දේශීය)		✓	
සැපයීම් (ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	✓		
සැපයීම් (ඉන්ධන)		✓	
සැපයීම් (ආහාරපාන හා නිල ඇඳුම්)		✓	
නඩත්තු වියදම් (වාහන)	✓		
නඩත්තු වියදම් (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)	✓		
නඩත්තු වියදම් (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)	✓		
සේවා (ප්‍රවාහන)	✓		
සේවා (තැපැල් හා සන්නිවේදන)	✓		
සේවා (විදුලිය සහ ජලය)			✓
සේවා (බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු, වෙනත්)			✓
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)	✓		
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)			✓
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (වාහන)			✓
මූලධන වත්කම් අත්පත්කර ගැනීම් (ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ)	✓		
මූලධන වත්කම් අත්පත්කර ගැනීම් (යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ)	✓		
මූලධන වත්කම් අත්පත්කර ගැනීම් (ගොඩනැගිලි සහ ඉදිකිරීම්)			✓
හැකියා වර්ධනය (කාර්යමණ්ඩල පුහුණු)			✓
සුභසාධන වැඩසටහන්		✓	

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.1 හදුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේදක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	වාරි ව්‍යාපෘති 150 ක් ක්‍රියාත්මක කිරීම නිෂ්පාදන ගම්මාන 18 ක් ඇති කිරීම කිරීම	නව වාරි ව්‍යාපෘති 65 ක් ඉදිකිරීම හා නිෂ්පාදන ගම්මාන 18 ක් ස්ථාපිත කර අවසන් කිරීම		✓	
සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කාණ්ඩයක් සඳහාම ශරීර සුවතාව වර්ධනය කිරීම	ග්‍රාමීය ක්‍රීඩා පිටි 31 ක් ඉදිකිරීම	ග්‍රාමීය ක්‍රීඩා පිටි 29 ක් ඉදිකර අවසන් කිරීම			✓
සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම	පානීය ජල ව්‍යාපෘති 24 ක් ක්‍රියාත්මක කිරීම	පානීය ජල ව්‍යාපෘති 18 ක් ඉදිකර අවසන් කිරීම			✓
නම්‍යශීලි යටිතල පහසුකම් සංවර්ධන,තිරසාර හා පරිපූර්ණ කාර්මීකරණය හා නවෝත්පාදනය දිරිමත් කිරීම	ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 67 ක් ක්‍රියාත්මක කිරීම	2021 වර්ෂය තුල බදුල්ල දිස්ත්‍රික්කයේ මාර්ග කි.මී. 1.37 ක් ඉදිකර අවසන් කිරීම			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

- 2021 වර්ෂයේදී විමධ්‍යගත අයවැය වැඩසටහනේ 96% ක භෞතික ප්‍රගතියක් හා 88% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීම

- 2021 වර්ෂයේදී සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ 100% ක භෞතික ප්‍රගතියක් හා 84% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීම

- 2021 වර්ෂයේදී ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහනේ 94% ක භෞතික ප්‍රගතියක් හා 87% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීම

අභියෝග

- වෙළඳපොලේ අමුද්‍රව්‍ය හිඟය හා මිල වැඩිවීම හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති ඇස්තමේන්තු කිරීම සඳහා බාධා ඇතිවීම (රේටයන් නිතර නිතර වෙනස් වීම)

- රටතුල පවතින කොරෝනා වසංගත තත්වය

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යාකළමනාකරණය

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

6.3 මානව සම්පත් සංවර්ධනය

6.1 සේවක සංඛ්‍යාකළමනාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	53	46	07
තෘතීයික	48	27	21
ද්විතීයික	1170	1022	148
ප්‍රාථමික	141	129	12



6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

- ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07 ක් පැවතීම නිසා පුරප්පාඩු පැවති කාර්යාලවල රාජකාරී ආවරණයට සහ වැඩබැලීමට නිලධාරීන් යෙදවීමට සිදුවීම හේතුවෙන් එම නිලධාරීන්ගේ වැඩ කොටස් වැඩි වූ අතර, ආයතනයේ නියමිත ඉලක්ක ළඟා කර ගැනීමට එම හේතුව බාධකයක් විය

- සෙසු මට්ටම් වල නිලධාරී හිඟයත් සම්පූර්ණ කරගැනීමට නොහැකි වීම මත, ඉන්න නිලධාරීන්ගේ වැඩකොටස් වැඩි වූ අතර, ඒ හේතුවෙන් ඔවුන්ගෙන්ද උපරිම කාර්ය සාධනයක් නොලැබීම

- කාන්තා නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සිටීම නිසා ප්‍රසූත නිවාඩු යන අවස්ථා වලදී මෙවන් මානව සම්පත් හිඟයක් පැවතීම රාජකාරී ආවරණයට වෙනත් නිලධාරීන් යෙදවීමට ගැටළුවක් වීමත්, ආයතනය නිසි ලෙස පවත්වාගෙන යාමට බාධකයක් විය

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
2020 වර්ෂය සඳහා භාණ්ඩ සම්ක්ෂණය	120	2021.01.13	48,600.00	-	දේශීය	ක්‍රමවත් භාණ්ඩ සම්ක්ෂණය සිදු කරන ආකාරය පැහැදිලි කිරීම
ගණකාධිකාරි පුහුණු වැඩසටහන	20	2021.07.30	21,100.00	-	දේශීය	නවක ගණකාධිකාරිවරුන්ට කාර්යාල දැනුම් ලබාදීම
ශ්‍රී.ලං.පරි.සේ. ආධුනික නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව	06	2021.10.04 දින සිට 2021.10.25 දින දක්වා	11,800.00	-	දේශීය	නවක පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා කාර්යාල දැනුම ලබාදීම
රා.ක.ස. 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීමට අදාළ නිර්දේශිත දින 10 පාඨමාලාව	80	2021.11.22 දින සිට 2021.12.02 දින දක්වා	239,025.00	-	දේශීය	කාර්යාලක්‍රම, ගිණුම්ක්‍රම, විනය, තොරතුරු දැනගැනීමේ පනත, ඵලදායිතාවය පිළිබඳ පුහුණුව ලබාදීම
ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන	90	2021.12.14/15/16/17	135,700.00	-	දේශීය	ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගණකාධිකාරිවරුන් හා විෂය නිලධාරීන්ට පුහුණුව ලබාදීම
පෞද්ගලික ලිපිගොනු ආශ්‍රිත විනය/විමර්ශන පුහුණු වැඩසටහන	55	2021.12.22/23	73,500.00	-	දේශීය	පෞද්ගලික ලිපිගොනු භාරව සිටින විෂය නිලධාරීන්ට විනය හා විමර්ශන කටයුතු පිළිබඳ පුහුණුව ලබාදීම
ග්‍රාම නිලධාරීන් සඳහා සීමා නීර්ණ පුහුණු වැඩසටහන	500	2021.12.22/23/27	54,050.00	-	දේශීය	සීමා නීර්ණ දැනුම ලබාදීම
ප්‍රාදේශීය පරිපාලන සේවයේ නියුතු නිලධාරීන් සඳහා ඉඩම් සම්බන්ධ පුහුණු වැඩසටහන	50	2021.12.28	43,200.00	-	දේශීය	ඉඩම් සම්බන්ධ දැනුම ලබාදීම
ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා සීමා නීර්ණ පුහුණු වැඩසටහන	20	2021.12.30	11,400.00	-	දේශීය	සීමා නීර්ණ දැනුම ලබාදීම
ග්‍රාම නිලධාරීන් සඳහා ඉඩම් සම්බන්ධ පුහුණු වැඩසටහන	500	2021 නොවැම්බර්	680,000.00	-	දේශීය	ඉඩම් සම්බන්ධ දැනුම ලබාදීම

*ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

- නවක පරිපාලන සේවයේ නිලධාරීන්ට හා නවක ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ට සේවාරම්භක පුහුණුවක් ලබාදීම තුළින් ආයතනය තුළ ක්‍රියාත්මක වන සේවාවන් මොනවාද යන්න හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදීම තුළින් ඔවුන්ගෙන් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හැකි වීම

- භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින්, සමීක්ෂණ මණ්ඩල වල සාමාජිකයන්ට එම කටයුතු නිවැරදිව කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුමක් ලැබීම හා ඒ තුළින් නිවැරදි සමීක්ෂණයක් සිදුවීම ආයතනයේ ඉදිරි කටයුතු සඳහා උපකාරී වීම

- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ පුහුණුව ලබාදීම තුළින් එම පද්ධතියේ ක්‍රියාකාරීත්වය වඩාත් නිවැරදිව කළහැකිවීම හා ඒ තුළින් ආයතනයේ කාර්යයන් වඩාත් කාර්යක්ෂම වීම

- සීමානීර්ණ පිළිබඳ පුහුණුව, ඉඩම් සම්බන්ධ පුහුණුව ප්‍රාදේශීය පරිපාලන සේවයේ නිලධාරීන්ට හා ග්‍රාම නිලධාරීන්ට ලබාදීම තුළින් ඔවුන්ගේ රාජකාරී කටයුතු වඩාත් නිවැරදිවත්, පහසුවෙනුත් කරගත හැකිවීම

- රාජ්‍ය කළමනාකරණ සේවයේ පළමුවන ශ්‍රේණියේ නිලධාරීන්ට ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමට අවශ්‍ය දින 10 පාඨමාලාව පැවැත්වීම මඟින් ඔවුන්ට කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යාමට හැකිවීමත්, ඒ තුළින් ලබන කාර්යාලක්‍රම, ගිණුම්ක්‍රම, විනය, තොරතුරු දැනගැනීමේ පනත, ඵලදායිතාවය සම්බන්ධ දැනුම රාජකාරී කටයුතු වලට මෙන්ම ඉදිරි උසස්වීම් විභාග සඳහාද ප්‍රයෝජනවත් වීම

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්ථාව

7.1 අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

අංශය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ			
1.2	වෙනත්	අදාල නොවේ			
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
2.10	උපපත්‍රිකා පොත් ලේඛනය (GAN-20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			

අ.ක්‍රියා අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
3	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ/115)				
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ			
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුල දැනුවත් කිරීම	අනුකූල වේ			
3.3	ආයතනය තුල සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ			
3.4	2014.05.11 දිනැති අංක 171/2007 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ			
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල වේ			
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ			
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල වේ			
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ			
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැයදෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ			
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිතදිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			

ඡේදය අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ			
5	**විගණන විමසුම්**				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම		අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයට සාමාන්‍ය පරිදි රාජකාරි ඉටුකිරීමට නොහැකි වීම	
6	**අභ්‍යන්තර විගණනය**				
6.1	මු.රෙ.134 (2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම		අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයට සාමාන්‍ය පරිදි රාජකාරි ඉටුකිරීමට නොහැකි වීම	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිට ඉදිරිපත් කිරීම	අනුකූල වේ			

ඡේදය අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාල වර්ෂය තුල පවත්වා ගෙන තිබීම	අනුකූල වේ			
8	**වත්කම් කළමනාකරණය**				
8.1	අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකුපත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ			
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 5-2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම		අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයට සාමාන්‍ය පරිදි රාජකාරි ඉටුකිරීමට නොහැකි වීම	

අ.ක්‍රියා අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම		අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයට සාමාන්‍ය පරිදි රාජකාරි ඉටුකිරීමට නොහැකි වීම	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ			
9	**වාහන කළමනාකරණය**				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම				
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයේදී අපහරණය කර තිබීම		අනුකූල නොවේ	මූලික පරීක්ෂන කටයුතු අවසන් නොවීම හා නඩු කටයුතු අවසන් නොවීම	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**				
10.1	නියමිතදිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූහා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ			
11	**ප්‍රතිපාදන උපයෝජනය**				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒ වායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ			
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂඅවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ			
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**				
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ			
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ			
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		අනුකූල නොවේ	ඌව පළාත් සභාව වෙතින් නිරවුල් කර නොතිබීම	

ඡේදය අංක	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවීනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
13	**පොදු තැන්පත් ගිණුම**				
13.1	කල් ඉකුත් වූ තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			
14	**අග්‍රිම ගිණුම**				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ			
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ			
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ			
15	**ආදායම් ගිණුම**				
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ			
15.2	රැස්කළ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කරතිබීම	අනුකූල වේ			
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			

අංශය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
16	**මානව සම්පත් කළමණාකරය**				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩය පවත්වාගෙන යාම	අනුකූලවේ			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ			
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණසේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ			
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**				
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ			
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ්අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම		අනුකූල නොවේ	ශ්‍රී.තො.තා. නියෝජිත ආයතනය විසින් ලබා දී ඇති වෙබ් අඩවියේ ඒ සඳහා පහසුකම් සලසා නොතිබීම	
17.3	තොරතුරු දැන ගැනීමේ පනත 8 වන හා 10 වන වගන්ති ප්‍රකාර වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ			
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි ,පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනවිසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 2/2018 ඇමුනුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ			
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ			

ඡේදය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)		අනුකූල නොවෙනම් ඒ සඳහා කෙටි පැහදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම	අනුකූල වේ			
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ			